# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2017 නොවැම්බර් මස 02 වන දින

## II වන කොටස

## අතිරේකය

(2017. 11. 08 දින නිකුත් කරන ලදී)

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 12.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අඅ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, පනතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනුකූලතාව ඇති කිරීමට සැලැස්වීම වේ.

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්
# (සංශෝධන)

එල්.ඩී.– ඕ. 55/2017

## (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2017 අංක දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අඅ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 262 වන අධිකාරයේ 65අඅ වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ “65ආ වගන්තියේ (3) උපවගන්තිය යටතේ නිශ්චිත වශයෙන් තෝරා පත් කර ගත යුතු සහ තෝරා යැවිය යුතු සංඛ්‍යාව ඉක්මවන අවස්ථාවක දී, යම් කාන්තා සභිකයකු ඇතුළත් නොවන අවස්ථාවක, එවිට මේ පනතේ (3) වන (4) වන උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “65ආ වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිශ්චිත වශයෙන් තෝරා පත් කර ගත යුතු සහ තෝරා යැවිය යුතු සංඛ්‍යාව ඉක්මවන අවස්ථාවක දී සහ එම තෝරා පත් කර ගත් සභිකයන් සංඛ්‍යාවට කිසිදු කාන්තා සභිකයකු ඇතුළත් නොවන අවස්ථාවක දී, එවිට මේ පනතේ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන එම පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට අදාළ නොවිය යුතු ය.” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ “තුන් දෙනකු තෝරා පත්කර ගෙන හෝ තෝරා යවනු ලැබ ඇති අවස්ථාවක දී, (3) වන සහ (4) වන උපවගන්ති ප්‍රකාරව එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් කාන්තා සභිකයන් තෝරා යැවීම අවශ්‍ය

2—PL 010429 -475 (2017/11)

නොවන්නේ ය.'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''තුන් දෙනෙකුට අඩුවෙන් තෝරා පත්කරගෙන හෝ තෝරා යවනු ලැබ ඇති අවස්ථාවක දී, මේ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන එම පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට අදාළ නොවිය යුතු ය.'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ පිළිවෙළින්, ''(2) වන උපලේඛනයේ '' සහ ''කාන්තා සභිකයන් වෙන් කිරීම'' යන වචන සහ ඉලක්කම වෙනුවට පිළිවෙළින් ''(2) වන උපවගන්තියේ '' සහ ''කාන්තා සභිකයන් බෙදා වෙන් කිරීම'' යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(4) එම වගන්තියේ (4) වන උපවගන්තියේ ''එම අඩු වන සාමාජිකයන් සංඛ්‍යාව, 9 වන වගන්තිය යටතේ සභිකයකු වීම සඳහා නුසුදුසු වන්නා වූ කාන්තා අපේක්ෂිකාවන් හැර පළමු නාමයෝජනා පත්‍රයේ හෝ අතිරේක නාමයෝජනා පත්‍රයේ වූ කාන්තා අපේක්ෂිකාවන් අතරින් යැවිය යුතු ය.'' යන වචන සහ ඉලක්කම වෙනුවට ''එම අඩු වන සාමාජිකයන් සංඛ්‍යාව, තෝරා පත්කරගෙන ඇති හෝ 9 වන වගන්තිය යටතේ සභිකයකු වීම සඳහා නුසුදුසු වන්නා වූ කාන්තා අපේක්ෂිකාවන් හැර පළමු නාමයෝජනා පත්‍රයේ හෝ අතිරේක නාමයෝජනා පත්‍රයේ වූ කාන්තා අපේක්ෂිකාවන් අතරින් තෝරා යැවිය යුතු ය.'' යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්; සහ

(5) එම වගන්තියේ පැති සටහන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:—

''කාන්තා සභිකයන් බෙදා වෙන් කිරීම.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.